**ධම්මිකා විජයසිංහ**
අධ්‍යක්ෂ, පරිසර සැළසුම් සහ ආර්ථික අංශය
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

# මිහිදුම් සිහිනය

"චානි, අපි කොහොම හරි ශිෂ්‍යත්වෙ පාස් කරවලා පුතාව ඉංජිනේරුවෙක් කරවන්න ඕනෙ". ජගත් කීවෙ මුවින් පිටවන දුම් වළලු අතරින් පුංචි ධනුක දිහා බලමින්. භූමිතෙල් බෝතලේ ලිපට ඇල කරලා දර කෑලි ටික ලං කරන ගමන් චානිකා පුතා දිහා බැලුවා. ජගත්ගෙ දුම් වැටියෙන් නැගුනු හුරුපුරුදු සුවඳ පරදවගෙන භූමිතෙල්වල කටුක ගඳ චානිකාගෙ නහයට දැනුනා. තෙල් ටිකත් එක්කම ඉහළට පැන නැගපු ලිපේ ගිනි දැල්ලේ එළියෙන් කුස්සියේ පැත්තක පුංචි පුටුවකට වෙලා පොතත් උකුලෙ තියාගෙන නිදාවැටෙන පුතාගෙ මූණ රත්තරං පාටට පෙනුනා. "පවු, පොඩි එකාට හරිම මහන්සි පාටයි. මේ ටිකේ ක්‍රීඩා තරඟවලටත් පුරුදු වෙනවනේ. ගිය සැරේ මගේ පුතා පළාත් තරඟෙන් එකොළහෙන් පහළ ශූරයා. ආයෙමත් විටමින් එකක්වත් අරන් දෙන්න ඕනෙ මේ ඇලි මැලි ගතිය නැතිවෙලා යන්න" චානිකා හිතුවා.



ජගත්ගෙයි, චානිකාගෙයි ලොකුම හීනෙ තමන්ගෙ එකම දරුවා ධනුක තමන් ඉන්න තැනට වඩා ඉහළ තැනකට ගෙනියන එක. ජගත් පාසල් වෑන් එක්ක වැඩ කරනවා. අමාරුවෙන් ෆිනෑන්ස් කරලා මේ වාහනේ ගත්තෙ. අනිත් යාලුවො වගේ තැන තැන බොන්න, රස්තියාදු වෙන්න ජගත් කැමති නැහැ, පාසැල් නිවාඩු කාලෙටත්, සති අන්තවලත් පිට හයර් දුවනවා වැඩිපුර කීයක් හරි හම්බ කරගන්න. වරදකට කියලා කරන්නේ ඔය දුම්වැටි උරන එක තමා. ඒත් තමනුත් දරුවත් වෙනුවෙන් ගොඩක් මහන්සි වෙන ජගත්ගෙ මේ පුංචි වැරැද්දටත් බනින්න පුළුවන්ද? චානිකා තමන්වම සාධාරණීකරණය කරගන්නවා.



"ඒක නෙවේ, ඔයා වාහනේ ආදායම් බලපත්‍රෙ අළුත් කරගත්තද?" චානිකා හදිසියෙම මතක් වෙලා ඇහුවා. ජගත්ගෙ තොල නොපිට පෙරළුනා. "නෑ අනේ. කොහෙද මේ දුම් සහතිකේද මොකක්ද එක නෑ කියලා දෙන්න බෑ කීවනේ". චානිකාට මතකයි නිතරම දැන්වීම්වල කියනවා දුම් සහතිකය ගන්න ඕනෙ කියලා වාහනවලට. "එහෙම කියලා බැහැනෙ ජගත්. ටෙස්ට් එක කරගන්නකෝ අර හන්දියෙ තියෙන තැනට ගිහින්". "මම ගියා චානි. වාහනේ ෆෙල් උනානේ. ආයෙම ඇංජිම සුද්ද කරගෙන එන්න කීවා. මට කොහේද ගරාජ් ගානෙ රස්තියාදු වෙන්න

වෙලාවක්. අද ගිහින් අරූගෙ අතට කීයක් හරි මිට මොළවලා ඔය වැඩේ කරගන්නම්" ජගත් කීවා.


පාසැල් බෑග් එකත් එල්ලගෙන එළියට බහිනකොටත් ධනුක හිටියෙ මලානික ගතියෙන්. "කෝ පුතා, පොඩ්ඩක් දුවලා කරලා එන්නකෝ" ජගත් වාහනය පණගන්වන ගමන් ධනුකට කීවා. වාහනෙන් පිටවුන දුම් පාරත් එක්ක පොඩි එකා කහින්න පටන්ගත්තා. "ඔය වාහනේ පිටිපස්සෙන් අයින් වෙන්න ළමයෝ. දුම් වැදිලා කමිසෙත් කිළිටි වෙනවා" චානිකා ධනුකගේ අතින් ඇදලා පැත්තකට කරන ගමන් කීවා. ජගත් ඉහළට ගත්ත දුම් උගුර එළියට මුදා හරිමින් වාහනේ ඉස්සරහට ගත්තා. පුතාවත් අරන් වාහනේ නොපෙනී යනතුරු චානිකා බලන් හිටියෙ පාළුවත් එක්ක. හිමිදිරියේ මීදුම නිසා වෑන් එකෙන් පිටවුන දුම්රොටු තුනීවෙලා ගියේ බොහොම හෙමීට. චානිකා සුසුමක් හෙළලා ගේ දිහාවට හැරුණා.



දවල් කවදාවත් නැති වෙලාවක දුරකථනය නාද වෙනකොට චානිකා පුදුම වුණා. "කවුද මේ අවේලාවෙ?" දුරකථනය අතට ගන්න ගමන් ඇය හිතුවා. "මොනවා, පුතාගේ ටීචර්. ඇයි දන්නේ නෑ හදිස්සියේ? ....... හෙලෝ..." චානිකාගෙ කටහඬ ටිකක් වෙව්ලුවා. "චානිකා, කලබල වෙන්න එපා. අද ක්‍රීඩා තරඟ අතරෙ ධනුකව වැටුනා. අපි ඉස්පිරිතාලෙ අරන් ඇවිත් බෙහෙත් දැම්මා. පුතාට තාම ටිකක් සනීප නැති නිසා අපි තාම ඉස්පිරිතාලෙ" චානිකාට හීනෙන් වගේ ඇහුනා. "අනේ ටීචර්, අපේ පුතාට දැන් කොහොමද?" චානිකාට කෙඳිරි ගෑවුනා. "බයවෙන්න එපා, මම පුතා ළඟ ඉන්නවා. ඔයා ඉක්මනට බබාගේ තාත්තවත් එක්කගෙන ඉස්පිරිතාලෙට එන්නකෝ." දුරකථනය විසන්ධි වෙලා ටික වෙලාවක් යනතුරුත් චානිකාට හෙලවෙන්න බැරි වුණා. ඉන් පස්සෙ ඇය කලබලෙන් ජගත්ට කතා කළා.

ජගත් චානිකාගෙ අතින් ඇදගෙන වාට්ටුවට ඇතුල් වෙනකොටත් චානිකාගේ ඇස් හෙව්වෙ ධනුකව. අනේ.. නහය-කට වැහෙන්න කෝප්පයක් වගේ එකක් දාලා, ලොකු සිලින්ඩරයකට හයි කළ බටයක් සම්බන්ධ කරලා. පුතා අමාරුවෙන් වගේ හුස්ම ගන්නෙත්. චානිකාගෙ හිත පිච්චිලා ගියා. කම්මුල් දිගේ රූරා හැළෙන කඳුළු පිහිදගන්නවත් චානිකාට සිහියක් තිබුණෙ නැහැ. "මේ ධනුක පුතාගෙ අම්මයි තාත්තයිද? අන්න දොස්තර මහත්තයා පොඩ්ඩක් ඇවිත් හම්බවෙන්න කීවා" සුදු නිල ඇඳුමක් ඇඳගත් හෙදියක් කීවා. චානිකා පුතා ලඟින් ඈත් වුනේ හිතකින් නෙවේ. දෙන්නම හෙදිය පිටුපස වෛද්‍යතුමාගේ කාමරය දෙසට ඇදුණා.

ඔවුන් කාමරයට ඇතුල් වෙන විට වෛද්‍යතුමා එක්ස් කිරණ සටහනක් ආලෝකය දෙසට අල්ලාගෙන පරීක්ෂා කරනවා. ඔහුගේ මුහුණෙ තිබුණෙ බැරෑරුම් පෙනුමක්. එක්ස් කිරණ සටහන පහතට ගන්න ගමන් ඔහු තමන් ඉදිරිපිට බියපත් මුහුණින් බලා සිටින දෙමාපියන්



දෙස බැලුවා. "සර්, මේ අර ධනුක පුතාගෙ..." වෛද්‍යතුමා ජගත්ටත් චානිකාටත් තමන් ඉදිරියේ තියෙන පුටු දෙක පෙන්නලා ඉඳගන්න කීවා. "ඇයි අම්මේ මේ දරුවා ගැන මීට වඩා ටිකක් හොයලා බැලුවෙ නැත්තේ? දරුවා දුර්වල වෙලා කියලා දැක්කෙ නැත්ද?" වෛද්‍යතුමා නළල රැළි කරගෙන කීවා. "අනේ සර්, පුතා දැන් ටික කාලෙක ඉඳන් මහන්සියි මහන්සියි කියනවා. අපි හිතුවෙ මේ ක්‍රීඩා තරඟවලට ලැහැස්ති වෙන නිසා කියලා. මේ අවුරුද්දෙ ශිෂ්‍යත්වෙ නිසා පාඩම් වැඩත් ටිකක් වැඩිනෙ." චානිකා කීවෙ බැගෑපත් හඬකින්. "එහෙම නෙවේනෙ අම්මේ. මේ දරුවගේ පෙනහළු හොඳටම දුර්වල වෙලා. ඔයාලා දැක්කෙ නැත්ද මේ දරුවා සුව නොවෙන කැස්සකින් පෙළෙනවා එහෙම? දරුවගේ ක්‍රියාකාරකම්වල වෙනසක් තියෙනවා කියලා තේරුනේ නැත්ද?". මෙවර ජගත් හඬ අවදි කළා. "අනේ සර්, දරුව ටිකක් දුර්වල වෙලා කියලා පෙනුනා. අපි විටමින් එහෙමත් ගෙනල්ලා දුන්නා. කැස්සටත් අර ෆාමසියෙන් පැණියක් ගෙනත් දුන්නා. බෝතල් දෙකකටත් වැඩිය ඉවර වෙන්න බීවා. ඒත් තවම හරි ගියේ නැහැ."

වෛද්‍යතුමා යන්තමට හිනා වෙලා හිස දෙපසට සෙලෙව්වා. "නැහැ තාත්තේ. විටමින් දීලා, කැස්සට මොනව හරි පැණියක් දීලා හරි යන්නෙ නැහැ. අපේ පරිසරයේ විස දුම් පිරිලා තියෙනවා නම් ඒවා නිසා අපේ පෙනහළු නරක් වෙනවා. බලන්නකෝ පාරට බැස්සම තියෙන වාහන ගොඩ. වැඩි හරියක් වාහන එන්ජින් එක හරියට සුද්ධ කරලා පවත්වාගෙන යන්නේ නැහැ. දුම් කෝච්චි වගේ. අහිංසක ළමයි තමා දුක් විඳින්නෙ." මේ වචනත් එක්ක තමන්ගේ වාහනේ මතක් වෙලා ජගත් හෙමීට බිම බලාගත්තා. දිනපතා තමන්ගේ වාහනේ පාසැලට යන එන ඒ අහිංසක මූණු ටික එයාගේ ඇස් ඉදිරිපිට මැවී පෙනුනා. "ඒ විතරක් නෙවේ, බලන්න ගොඩක් පිරිමි හිතනවා සිගරට් එකක් පත්තුකරගත්තම හරි උජාරුයි කියලා. ඒත් එයාලා හිතන්නෙ නැහැ ඒ මඟින් තමන්ටත් වඩා අනතුරට පත් වෙන්නෙ තමන් වටේ ඉන්න තමන්ගෙ ආදරණීය අය කියලා. අපි එයාලව ඉක්මනින් මරණය කරා අරන් යනවා" එතකොට නම් ජගත්ගෙ පපුව නැවතුනා වගේ. චානිකා ඉක්මනට ජගත් දිහා බැලුවා. ජගත්ගේ සිගරට් දුමින් අවපැහැ වුණු දෙතොල් වෛද්‍යතුමාට අවශ්‍ය කතාව කීවා.

"අම්මලා තාත්තලා දරුවො ගැන මීට වඩා පරිස්සම් වෙන්න ඕනෙ. දැන් සෑහෙන කාලයක් යනකල් මේ දරුවට බෙහෙත් කරන්න ඕනේ. ක්‍රීඩා කටයුතුවලිනුත් ඈත් වෙලා ඉන්න වෙනවා. එළියේ අරගෙන යනකොට මුහුණු ආවරණයක් පළඳින්න වෙනවා. අම්මලා තාත්තලත් දැනගන්න ඕනෙ නිවස තුළ දුම්බීම, දර, භූමිතෙල් දැල්වීම වගේ දේවල් පෙනහළුවලට ඉතාමත් නරක බව. මේවයින් ඔයාලා වගේම අපේ අනාගත පරපුරත් ලෙඩුන් බවට පත්කරනවා." ජගත්ගෙත්, චානිකාගෙත් පපුවේ බර තවත් වැඩි කරමින් වෛද්‍යතුමා කියාගෙන ගියා.